# අතීතයට ගිය පුංචි සංචාරකයා



කතෘගේ නම
දිනුකි චාන්දනා කුමාරි

# අතීතයට ගිය පුංචි සංචාරකයා

කතෘගේ නම

# දිනුකි චාන්දනා කුමාරි

පාසල - මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ඉගෙනුම ලබන පංතිය - 6 ශ්‍රේණිය B

කෘතිය පල කරන දිනය - 2026/05/10

ISBN : 978-624-211-312-8

# පිදුම

"මා ඉගෙන ගන්නා පාසලටත්,

මට අකුරු කරනා ආදරණීය ගුරු

මෑණිවරුන්ටත්, පියවරුන්ටත්,

මා දිරිමත් කරන ආදරණීය

මව්පියන්ටත්,

වික්‍රමාන්විත ඉතිහාසයකට ආදරය කරන

කල්‍යාණයන්ටත්.....

**මේ පුංචි කතා පොත ආදරයෙන් පුදනු ලබමි !**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CS CamScanner

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,  
දියවඩන නිලමේ,  
ශ්‍රී දළදා මාලිගාව  
2026.05.10

# පටුන

1. අමුතු ඔරලෝසුව
2. සෙනුක රජතුමා හමුවීම
3. රජතුමාගේ අපූරු සැලසුම
4. සෙනුකගේ බුද්ධිමත්කම හා නුවණ
5. රජුගේ පුංචි තෑග්ග හා සමුගැනීම


# 1. අමුතු ඔරලෝසුව



සෙනුක කියන්නේ ඉතිහාස කතාවලටහරිම ආස පුංචි පිරිමි ළමයෙක් දවසක් සෙනුක තමන්ගේ සීයලාගේ ගෙදර තිබුණ පරණ අට්ටාලය අස් කරමින් හිටියා. දූවිලි වැසුණු පරණ පෙට්ටියක් අස්සේ තිබිලා එයාට අපූරු වස්තුවක් හමු වුණා. ඒක පිත්තලවලින් හදපු, අමුතු සලකුණු කොටපු පැරණි අත් ඔරලෝසුවක් වගේ උපකරණයක් සෙනුක හෙමින් සැරේ ඒකේ තිබුණ රවුම් කට්ටක් කැරකෙව්වා. එක පාරටම මුළු කාමරයම නිල් පාට ආලෝකයකින් පිරී ගියා !



සෙනුකට පුදුම හිතුණා. එයාට දැණුනේ අහසේ පාවෙලා යනවා වගේ තත්පර කිහිපයකට පස්සේ සෙනුක ඇස් ඇරලා බැලුවා. එයා හිටියේ සීයලාගේ ගෙදර නෙවෙයි. වටේට ම තිබුණේ විශාල ගස්වලින් පිරුණු වනාන්තරයක් අහස උසට විහිදුණු විශාල ගල් පර්වතයක් එයාට ඇතින් පෙණුනා. “ දෙවියනේ , මම කොහේ ද මේ ඉන්නේ ? ” සෙනුක තමන්ට ම කියා ගත්තා.



“කවුද තෝ? මේ රාජකීය වනයට අවසර නැතුව ඇතුළු වුණේ ඇයි?” එකපාරටම ගොරෝසු කටහඬක් ඇසුණා. සෙනුක හැරීලා බැලුවා. එතන හිටියේ අමුතු විදිහට ඇඳගත්තු , අතේ හෙල්ලක් තියාගත්තු ආරක්ෂක සෙබළෙක්! සෙනුක ගොත ගසමින් “ අනේ මම .... මම සෙනුක. මම දන්නේ නෑ මම මෙහෙට ආවේ කොහොමද කියලා” සෙනුක බයෙන් කිව්වා.



සෙනුකගේ අමුතු ඇඳුම් දැකපු සෙබළාට මේක ලොකු සැකයක් වුණා.“ තෝ අනිවාර්යෙන්ම සතුරන්ගේ ඔත්තුකාරුවෙක් ! වහාම මාත් සමග රජතුමා ළඟට යමු”, සෙබළා සෙනුකව කැඳවාගෙන යාමට සූදානම් වුණා.සෙනුක බය වුණත්, එයාගේ හිතේ කුතුහලයක් ඇති වුණා. එයා මේ යන්නේ ඇත්තම රජ මාලිගාවකට ද?



## 2.සෙනුක රජතුමා හමුවීම

විශාල ලෙනක් ඇතුළේ ලස්සනට සරසපු අසුනක රජතුමා වාඩි වී සිටියා. සෙබළා රජුට වැද සෙනුකව ඉදිරිපත් කළා. සෙනුක තමාගේ ඉතිහාසය පොතේ කරුණු මතක් කරලා බැලුවා.“ මේ ..... මේ ශ්‍රේෂ්ඨ වළගම්බා රජතුමා නේද?” එයාට ඉබේම කියවුණා. රජතුමා සෙනුක දෙස කරුණාවෙන් බලලා “ පුංචි දරුවා, බය නොවී කියන්න තෝ කවුද ? ” කියලා ඇහුවා.

# 3.රජතුමාගේ අපූරු සැලසුම




සෙනුක රජතුමාට වැන්දා . ඊට පස්සේ තමන් අනාගතෙන් ආපු හැටිත් , අර අද්භූත ඔරලෝසුව ගැනත් එයා රජුට කිව්වා. මාලිගාවේ සිටි ඇමති වරු මේක විශ්වාස කළේ නැතත් බුද්ධිමත් වළගම්බා රජතුමා සෙනුකගේ ඇස් දෙස බලලා එය වටහා ගත්තා. “ ඔබ අනාගතයේන් ආපු අමුත්තේක් නම්, අපේ රටේ අනාගතය ගැන මට කියන්න. රජතුමා ඉල්ලා සිටියා.



සෙනුක එවිට ආඩම්බරයෙන් කතා කළා. “ රජතුමනි , සතුරන් නිසා ඔබ සැගවී සිටියත් ඔබ සැම සතුරෙක්ම පරදවා මුළු රටම එක්සේසත් කරනවා. අනාගතයේ මිනිස්සු ඔබ හට ගරු කරන්නේ මහා විරුවෙකු විදිහටයි” එයා රජුට කිව්වා. රජතුමා එය අසා බොහෝ සතුටට පත් වුණා.



රජතුමා සෙනුකව ළඟට කැඳෙව්වා “ පුංචි දරුවා මම දැන් ඉන්නේ මගේ සේනාවත් එක්ක මාතලේ අළුවිහාරය කියන මේ පර්වත ලෙනේ අපේ බුදු දහම අනාගතයට රැක ගැනිම සදහා අළුවිහාරයේදී මහා සංඝරත්නය එකතු කරලා , මෙතෙක් කටපාඩමින් ආපු ‘ත්‍රිපිටකය’ පුස්කොළ පොත්වල ලියවන්න තිරණය කළා.” රජතුමා තමාගේ මහා සැලසුම සෙනුකට කිව්වා.



රජතුමා සෙනුකව පුස්කොළ පොත් ලියන ස්ථානයට කැඳවාගෙන ගියා. එතන බොහොමයක් ස්වාමීන් වහන්සේලා ‘පන්හිද’ අධාරයෙන් පුස්කොළ පොත් වල අකුරු කොටමින් සිටියා. සෙනුක පුදුමයෙන් බලා සිටියා. අනාගතයේ පොත් මුද්‍රණය කරනවාට වඩා කෙතරම් අපහසුවෙන්ද එදා ඒ කාර්ය කළේ. සෙනුකට හිතුනා.

# 4. සෙනුකගේ බුද්ධිමත්කම හා නුවණ




සෙනුක බෙහෙම කැමැත්තේන් මේ දේවල් දෙස බලා සිටිනවා දුටු වළගම්බා රජතුමා , සෙනුකට රාජකිය දිවා ආහාරය සුදනම් කළා. අනාගතයේ කන කැම වගේ නෙවෙයි, එවා ඉතා ප්‍රණීත බව සෙනුකට හිතුණා. එයා කවදාවත් ඒ වගේ රසවත් පෝෂණීය කැමක් කාලා තිබුණේ නෑ



කෑම කන අතරතුර , එක පාරටම ඔත්තු කරුවෙක් දුවගෙන ඇවිත් කිවා “ රජතුමනි, සතුරන් අපව මුළු කැලයම පීරමින් සොයනවා.” කියා මෙය ඇසු විට මුළු ලෙනම කලබල වුණා.

සෙබළු යුද්ධයට සුදානම් වුණා. සෙනුකගේ හදවත වේගයෙන් ගැහෙන්න ගත්තා. රජතුමා අනතුරේ වැටෙනවාට ඔහු කැමති වුණේ නැහැ.

සෙනුක තම බෑගයේ තිබු ලේසර් ලයිට් එක හා විසිල් එක ගෙන වේගයෙන් පිටතට දුවගෙන ගියා. සතුරන් එන දෙසට ලේසර් ආලෝකය විහිදුවමින්, විසිල් එක හයියෙන් පිම්බා සතුරන් " අත්භූත යක්ෂයෙකු" කියලා බියවී ආපසු හැරිලා දිවුවා.




# 5.රජුගේ පුංචි තෑග්ග හා සමුගැනීම



සෙනුකගේ බුද්ධිමත් කම නිසා සතුරන්ගෙන් බේරුණා වළගම්බා රජතුමා සෙනුකට ස්තූති කරා. "ඔබ අනාගතයෙන් ආපු වීරයෙක්" රජතුමා සතුටින් කිව්වා. රජු තමාගේ රාජකීය මුද්ද සෙනුකට තෑගි කළා. සෙනුක රජතුමාට ස්තූති කර එය ලබා ගත්තා.



දැන් සෙනුකට ගෙදර යන්න කාලය හරි . එයා අද්භූත ඔරලෝසුව අතට ගත්තා . රජතුමාටත් , සෙබලළුන්ටත් වන්දනා කරලා සමුගත්තා . සෙනුක ඔරලෝසුවේ කටිට අනෙක් පැත්තට කැරකෙව්වා. නැවතත් නිල් පාට ආලෝකය මුළු පරිසරයම වසා ගත්තා. රජ මාලිගාව සහ අළුවිහාරය හෙමින් හෙමින් මැකී ගියා.



සෙනුක ඇස් අරිද්දි එයා හිටියේ සීයලගේ පරණ අට්ටාලයේමයි. ඔරලෝසුව අතුරුදහන් වෙලා තිබුණා. “ අනේ මම හිනයක් ද දැක්කේ ?” සෙනුක හිතුවා . හැබැයි එයා හෙමින් අත දිග හැරලා බලද්දි අත උඩ තිබුණේ රජතුමා දුන්න රත්තරන් මුද්දයි ! සෙනුක සතුටින් හිනා වුණා. එයා සැබෑ පුංචි සංචාරකයෙක්!



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No: - 978 -624-211-312-8